## කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2018

-----------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාල විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාල විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරනනේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී .තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ,ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති , පරිපාටි පොත්පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාල විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 07 හි 42 ඡේදය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට සියයට 100 ක් ක්ෂය කර තිබූ එහෙත් තව දුරටත් භාවිතා කරමින් පවතින පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර එහි සාධාරණ වටිනාකම් (Fair Value) මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයකට පොත්පත් සහ වාරසඟරා සඳහා 33.33 % මේ අනුව පොත් මිලදීගත් වර්ෂයේ සිට වසර 03 කට පසු නැවත පොත්වල වටිනාකම ගණනය කල යුතුවේ. එම ගණනය කර ඉදිරි වර්ෂයේදී නිවැරදි ක්ෂය කිරීම් කළ හැකිවේ. | ප්‍රමිත අංක 07 හි 42 ඡේදය ප්‍රකාරව ධාරණ අගය වාර්තාකරන දිනට වූ සාධාරණ වටිනාකම භාවිතා කරමින් නිශ්චය කරන අගයට වඩා ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන පරිදි ප්‍රමාණවත් විධිමත් භාවයකින් යුතුව ප්‍රත්‍යාගණනය කල යුතුයි. |

**1.5.3 ගිණුම්කරන අඩුපාඩු**

**------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ලද රු.26,000 ක් වූ ආපසු නොගෙවන තැන්පතු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ආපසු නොගෙවන තැන්පතු වල රු.26,000.00 ඊලඟ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට හැකිය. | උපචිත සංකල්පයට අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් රු.250,000 ක් වුවද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.350,000 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල විගණන ගාස්තු වෙන් කිරීම් රුපියල් 350,000 ක් ලෙස දක්වා ඇත. මෙය 2019 ගිණුම් වර්ෂයේදී වෙන් කිරීම් කිරීමේදී ගැලපිය හැකිය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ලෙජර ගිණුම් සහ ජර්නල් සටහන්වල දත්තයන් සමඟ සැසඳිය යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල වත්කම් වර්ෂ 07 ක රු.1,468,694 ක වාර්ෂික ක්ෂයවීම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අඩුවෙන් ගිණුම්ගත කර තිබූ ක්ෂය රු.1,468,694 ක ස්ථාවර වත්කම් ලේඛණය සම්පූර්ණ වූ පසු නිවැරදි කර ගත හැකිය. | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ස්ථාවර වත්කම් ක්ෂය කළ යුතුයි. |

**1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

**----------------------------------------**

| **විෂයය** | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම** | **වෙනස** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| දේපල පිරියත හා උපකරණ | 118,182,416 | 120,198,753 | 2,016,337 | දේපල පිරියත හා උපකරණ එකතු කිරීම යටතේ සිදුවී ඇති වෙනස ද නිවැරදි කර ගැනීමට ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සසඳා නිවැරදි කරනු ඇත. | නිවැරදිව වියදම් ගිණුම්ගත කල යුතුවීම හා පාලන ගිණුම් අතර සැසඳීම කළ යුතු විය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ගෙවිය යුතු වියදම | 3,202,478 | කේවල ශේෂ ලැස්තු | සන්නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අදාල අයිතමයන් සම්බන්ධව වෙන වෙනම ලේඛන පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් සමඟ අදාල උපලේඛණ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුයි. |
| රඳවා ගැනීම් | 121,432 | | | |
| විවිධ ණය හිමියන් | 1,852,000 | | | |
| තැන්පතු - ආපසු ගෙවිය යුතු | 199,620 | | | |
| තැන්තු - විවිධ ගෙවීම් | 748,775 | | | |

### 1.6. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) පනත්** | | | |
| 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | එක් නිලධාරියෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුල උපයන විට ආදායම් බදු රු.43,588 ක් අඩුවෙන් අයකර තිබුණි. | විගණන උපදෙස් පරිදි නිවැරදි කළ හැක. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුයි. |
| **(ආ) මුදල් රෙගුලාසි** 880 | රජයේ මුදල්, ආදායම්, මුද්දර, බඩු බාහිරාදිය පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. | මින් ඉදිරියට ඔබගේ උපදෙස් පරිදි ඇප මුදල් ලබාගෙන කටයුතු කරමි. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුයි. |
| **(ඇ) චක්‍රලේඛ** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මින් ඉදිරියට ඔබගේ උපදෙස් පරිදි ඇප මුදල් ලබාගෙන කටයුතු කරමි. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය -

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,235,014 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,232,106 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,467,120 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්ථන ලැබීම් හා අනෙකුත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යායතනය පිහිටි හෙක්ටයාර් 5.4 ක භූමි ප්‍රමාණය පවරා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.6,342,129 ක් වූ ඉදිකිරීම් සහ නවීකරණය කිරීම් සිදුකර තිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා අමාත්‍යාංශයට කීපවිටක්ම දන්වා ඇත. එම අනුමැතිය ලැබෙන තෙක් ආයතනයේ කටයුතු නතර කල නොහැකිය. නියමිත පරිදි වර්ෂ දෙක අවසානයේ සිසුන් පාඨමාලා අවසන් කල යුතුය. එසේ නොවුනහොත් දැනට රජයේ ආයෝජනය කර ඇති මුදල් අනාර්ථික වනු ඇත. එම නිසා අත්‍යවශ්‍ය ඉදිකිරීම් කිරීමට සිදුවී ඇත. | ඉඩම පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) ශීතකරණ සහ වායු සමීකරණ පාඨමාලාව සඳහා 2018 ජූනි 05 දින සිට ප්‍රදර්ශකවරයෙකු නොමැතිවීම හා කෘෂි යන්ත්‍ර තාක්ෂණ පාඨමාලාව සඳහා වසර දෙකක පමණ සිට ප්‍රදර්ශකවරයෙකු , විද්‍යාගාර සහායකයකු නොමැතිවීම හා අධ්‍යාන හා පුහුණු කටයුතු සඳහා ප්‍රමාණවත් උපකරණ නොමැතිවීම හේතුවෙන් එම අංශවල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකිවී තිබුණි. | කීපවිටක් දැන්වීම් පලකල ද සුදුසු අයදුම් කරුවන් සොයා ගැන්වීමට නොහැකි වී ඇත. එබැවින් මෙවරද 2019 අප්‍රේල් 04 දී අයදුම්පත් කැඳවා ඇත. | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා එම අංශවල කටයුතු කාර්යක්මව කිරීමට නොහැකි වී ඇත. අදාල තනතුරු සඳහා නොපැමිණීමට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | |
|---|---|---|
| (ඈ) මෝටර් රථ තාක්ෂණ පාඨමාලාව සඳහා ප්‍රදර්ශකවරයෙකු නොමැතිවීම සහ පුහුණු කටයුතු සඳහා Automobile Continuing traine panel එකක් නොමැතිවීම හේතුවෙන් එම අංශයේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකිවී තිබුණි. | කීපවිටක් දැන්වීම් පලකල සුදුසු අයදුම් කරුවන් සොයා ගැන්වීමට නොහැකි වී ඇත. එබැවින් මෙවරද 2019 අප්‍රේල් 04 දින අයදුම්පත් කැඳවා ඇත. | අදාල තනතුරු සඳහා නොපැමිණීමට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඇ) ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ඉලක්කගත සිසුන් දැනුවත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාඨමාලාවන් සඳහා සිසුන් බඳවාගැනීමට දෙවරක් පුවත්පත් දැන්වීම් පලකිරීමට සිදුවී තිබුණි. | ආයතන කීපයක ප්‍රදර්ශනවලදී එම කුටි භාරගෙන ප්‍රවර්ධන කටයුතු කර ඇති නමුත් සිසුන්ගේ ඉල්ලීම ඉතාම සීමා සහිත වී ඇත. හේතුව මෙම ආයතනය ස්ථානගත කර ඇත්තේ නගරයෙන් ඈත නිසාය. | පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන මට්ටමින් දැනුවත් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුල ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් දේශකවරුන් 16 කුගෙන් අධ්‍යාන කටයුතු පිළිබඳ ඇගයීම් සිදුකර තිබුණේ දේශකවරුන් දෙදෙනෙකුගෙන් පමණක් වූ අතර අතර බාහිර දේශකවරුන් 35 දෙනෙකු අතරින් කිසිදු දේශකවරයෙකුගේ දේශන පිළිබඳ ඇගයීමකට ලක්කර නොතිබුණි. | එම ඇගයීම් අධ්‍යක්ෂවරයා විසින් සිදුකරන ලද නමුත් ඒවා සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කිරීම බාහිර පාර්ශවයන් මගින් කිරීම සඳහා කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | සියළුම දේශකයන්ගේ දේශන කටයුතු ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය. |
| (ඊ) සේවා නියුක්තකයන්ගේ භාරකාර අරමුදලට නියමිත දින දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.2,574 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | පිළිගනිමි. මේ සම්බන්ධයෙන් 2019.05.03 කළමනාකරණ මණ්ඩලයට යොමු කර ඇත. | අධිභාර අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම සිදුවේ. මෙම කාල සීමාවේ දී ආයතනයේ සහකාර ලේඛකාධිකාරී තනතුරු මාරුවීමත්, අර්බුදකාරී තත්වයක් නිසා නොහැකි විය. ඉදිරියේදී පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අදාල අනුමැතිය ලබා ගත යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) සිසුන් බඳවා ගැනීම සෑම වර්ෂයකම අප්‍රේල් මස සිදුකරනු ලබන නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සිසුන් බඳවාගෙන තිබුණේ මාස 06 ක ප්‍රමාද කාලයක් සහිතවය. | විශ්වවිද්‍යාල විද්‍යායතන සියල්ලේම සිසුන් එකවර බඳවා ගැනීම සුදුසු බවට ආයතන අධ්‍යක්ෂවරුන් හා උප කුලපති රැස්වීම්වලදී සාකච්ඡා කර ගෙන තිබීම නිසා සිසුන් ගැනීම් සම්බන්ධව තීරණයකට පැමිණීම ප්‍රමාද විය. පසුව නැවතත් එම අදහස ඉවත් කිරීම නිසා ආයතන වලට අවශ්‍ය පරිදි සිසුන් බඳවා ගැනීම තීරණය විය. ඒ නිසා ප්‍රමාද විය. | නියමිත කාලයට සිසුන් බඳවාගැනීමට සැලසුම්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඇ)පාඨමාලාවන් 19 ක් සඳහා සිසුන් 270 දෙනෙකු බඳවාගත හැකි නමුත් සමාලෝචිත වර්ෂය සඳහා බඳවාගෙන තිබුණේ සිසුන් 223 කු පමණක් වන අතර ඉන් සිසුන් 08 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි. | සිසුන් බඳවා ගනු ලබන්නේ තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. එවිට බඳවා ගනු ලබන්නේ යම් මට්ටමකට නොකඩවා පාඨමාලාව කරගත හැකිවේ යැයි අපේක්ෂා කරන සිසුන්ය. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යන කිරීමේ අපහසුව, වෙනත් රැකියාවන් සඳහා ඉවත්වීම වැනි කරුණු නිසා පාඨමාලාව හැර ගොස් ඇත. | සුදුසු ක්‍රමවේද මත සුදුසු සිසුන් උපරිමයෙන් බඳවා ගැනීමට කටයුතු කලයුතු වේ. |
| (ඈ)සමාලෝචිත වර්ෂය සඳහා බඳවාගත් සිසුන් 104 දෙනෙකු කිසිදු අභියෝගතා පරීක්ෂණයකට යොමු නොකර බඳවාගෙන තිබුණි. | මෙම ආයතනයේ ස්ථාන ගත කිරීමේ දුෂ්කරතාවය නිසා සිසුන්ගේ ඉල්ලීම් ප්‍රමාණය සීමා සහිත වේ. වායු සමීකරණය වැනි ඇතැම් පාඨමාලා සඳහා ඉල්ලීම් කිරීම ඉතාමත් සීමා සහිතය. එවිට සිදු වනුයේ එක්වරක් පුවත්පත් දැන්වීම් වලින් බඳවාගන්නා ප්‍රමාණය අඩු වීමය. නැවත පුවත්පත් දැන්වීම් මගින් බඳවා තවත් මාස 2.3 පමණ කාලයක් ගත වනු ඇත. එබැවින් පාලන මණ්ඩලයේ අනුමැතිය මත අභියෝගතා පරීක්ෂණයක් නොමැතිව බඳවා ගෙන ඇත. | බඳවා ගන්නා සිසුන් අදාල පාඨමාලාව හැදෑරීමට යෝග්‍යද යන්න තහවුරු කිරීමෙන් අනතුරුව එක් එක් පාඨමාලාවට අනුකූල වන සේ සිසුන් බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සැකසිය යුතුයි. |
| (ඉ) 2015 වර්ෂයේ පාඨමාලා 04 ක් සඳහා බඳවාගත් සිසුන් 33 කු සමාලෝචිත වර්ෂය තුල පාඨමාලා සම්පූර්ණ කර ඇති නමුත් ඔවුන් රැකියාගැන්වීම පිළිබඳ පසු විපරමක් ආයතනය විසින් සිදුකර නොතිබුණි. | පසු විපරම් කල යුතු වන්නේ විශ්වවිද්‍යාල සහතික ලබා TVEC වාචික පරීක්ෂණයෙන් පසුවය. එය මේ දිනවල එම පරීක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු සිදුවේ. නමුත් මෙම ආයතනයේ පරිපාලන උපදේශකවරයාගේ උපදෙස් අනුව පසු විපරම් පවත්වා දැනට එම ලේඛන ලබාගෙන ඇත. | වෘත්තීය සුදුසුකම් ලබා ඉවත්ව යන සිසුන් පිළිබඳ පසු විපරමක් කලයුතු බව. |
| (ඊ) 2015 – 2018 දක්වා වූ කාලය තුල බඳවාගත් සිසුන් 781 දෙනාගෙන් සිසුන් 112 ක් හෙවත් සියයට 14 ක පමණ ප්‍රතිශතයක් පාඨමාලා හැරගොස් තිබූ | පාඨමාලා හැරයාමට හේතුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම හා ගණිතය වැනි විෂයන් අවබෝධ කිරීමට ඇති අපහසුතාවය වේ. ඉංග්‍රීසි අංශය මගින් | පාඨමාලා හැරයාමේ හේතූන් සොයා බලා පිළියම් යෙදිය යුතුයි. |

| | | |
|---|---|---|
| අතර එම තත්වය අවම කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | මේ නිසා ඉංග්‍රීසි භාෂා වැඩිපුර පැය ගණන් යොදා ඇති අතර ගණිතය සම්බන්ධයෙන් වයඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය වරයෙකු ගෙන්වා බාහිර දේශන පවත්වා ඇත. | |
| (ඇ) 2017 සහ 2018 වර්ෂය තුල පවත්වන ලද විභාග 03 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 07 සිට මාස 11 ක කාලයක්ද ගතවී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල විභාග 03 ක් පවත්වා මාස 06 ක කාලයක් ගතවී ඇතත් ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි. | විභාග ප්‍රතිඵල මෙම ආයතනයෙන් මසක් තුල පළමු වර පරික්ෂණ අවසන් කර TVEC වෙත දෙවන පරික්ෂාව සඳහා යවනු ලැබේ. ප්‍රමාදය සිදුවන්නේ TVEC ප්‍රතිඵල ඉක්මනින් නොඑවීමය. මේ පිළිබඳව SSDP ව්‍යාපෘතියට ද දන්වා ඇත. මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් පසු දෙවෙනි පරික්ෂාව අප සඳහා ආයතනය විසින් ම තෝරාගත් පරික්ෂකවරුනගේ ලැයිස්තුවක් අනුමත කර TVEC වලට යවා ඇත. | නියමිත දින වලදී ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුයි. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුල රුපියල් මිලියන 02 ක් වටිනා පොත් 345 ක් පුස්තකාලයට මිලදී ගැනීමට සැලසුම්කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම පොත් මිලදීගෙන නොතිබුණි. | පිළිගනිමි. 2018 වර්ෂයේ මිලියන හතක පොත්පත් මිලදී ගැනීම සඳහා ඇනවුම යවා ඇත. | ප්‍රසම්පාදන සැලසුමට අනුව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. |
| (එ) සමාලෝචිත වර්ෂය තුල පාඨමාලා 08 කට පෙනී සිටි සිසුන් 152 කුගෙන් විෂයයන් සියල්ලම එකවර සමත් වී ඇති සංඛ්‍යාව 41 ක් වී තිබුණි. | විෂයන් සියල්ලම එකවර සමත් වීම 41 කි. එහෙත් අනික් ශිෂ්‍යයන් ද බොහෝ විට අසමත් වී අත්තේ විෂයන් එකක් හෝ කීපයකි. එය මීලඟ වර්ෂයේ පරික්ෂණයේ දී පෙනි සිට සමත් වනු ඇත. | ප්‍රතිඵල ඉහල නැංවීමට සුදුසු ක්‍රමවේද හඳුන්වා දියයුතුයි. |
| (ඒ) ප්‍රමාණවත් සහ පිළිගතහැකි හේතු ඉදිරිපත් කිරීමකින් තොරව අවම මිල ගණන් ඉදිරිපත් කල ලංසුකරුවන් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පිරිසිදු කිරීමේ සේවා ගිවිසුම ප්‍රදානය කිරීමේදී රු.398,424 ක පාඩුවක් රජයට සිදුවී තිබුණි. | පිරිසිදු කිරීමේ සේවා ගිවිසුම අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය එනම් තාක්ෂණික කමිටුව මේ සම්බන්ධයෙන් නිවැරදිව කටයුතු කර ඇත. කෙසේ වෙතත් මෙය පාඩුවක් බව සඳහන් කර තිබුනත් එය පිළිගැනීමට අසීරු විය. මන්ද මෙම ආයතනනයේ ඉතාම සුළු ඒකකයක් හැටියට පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව නිසාද මෙය අත්‍යාවශ්‍ය කටයුත්තකි. | ප්‍රසම්පාදන නීති රීතිවලට අනුව කටයුතු කල යුතුවේ. |
| (ඔ) පාලක මණ්ඩලයේ හෝ අමාත්‍යාංශයේ අනුමැතියක් ලබාගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා රු.1,566,000 | මෙම කොන්ත්‍රාත්තුව පවරා ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ රජයේ ආයතනයකටය. විමසීම් අවශානම් මේ පිළිබඳව ගොඩනැගිලි | විධිමත් අනුමැතියක් සහිතව අත්තිකාරම් මුදල් ගෙවීම සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| ක අත්තිකාරම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවට විස්තර විමසා ලිපියක් යැවිය හැකිය. | |
| (ඕ) ප්‍රමාණවත් හේතු රහිතව ඉන්දියානු නිෂ්පාදන ප්‍රතික්ෂේප කර චීනයේ එකලස් කරන ලද විදුලිජනක යන්ත්‍රයක් මිලදීගැනීමට තීරණය කිරීම හේතුවෙන් රු.1,276,385 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | මේ පිළිබඳව විශ්වවිද්‍යාල විද්‍යායතන තාක්ෂණික කමිටුව වයඹ විශ්වවිද්‍යාලයෙන් ලබාගත් සහතිකයක් මත තීරණය කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රසම්පාදන කමිටුව පිළිගෙන ඇත. මෙම තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කරනු ලැබුවේ ඉතාමත් තාක්ෂණික දැනුමක් ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ හිටපු සාමාන්‍යාධිකාරී මගිනි. | නියමිත ප්‍රසම්පාදන පටිපාටි වලට අනුකූලව වැඩ හා සේවා ලබා ගැනීම් කල යුතුයි. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවද රු.6,057,000 ක් වටිනා පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් සඳහා අයවැය පිළියෙල කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ අනුමත වූ ප්‍රතිපාදන අනුවය. කෙසේ වෙතත් ප්‍රසම්පාදන සැලැස්මක් අවශ්‍ය වන්නේ නම් එයද පිළියෙල කල හැක. | ප්‍රසම්පාදන සැලැස්ම සියළු ප්‍රසම්පාදනයන් ඇතුලත් වන සේ සකස් කල යුතුයි. |
| (ආ) පාලක මණ්ඩලයේ හෝ අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව රු.6,693,000 ක් වූ කොන්ත්‍රාත් 02 ක ඉදිකිරීම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදීමේදී ඒ සඳහා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | 2018 සැප්තැම්බර් 03 වන දින අංක K/U/L/D/I/R 2018.09.03 දින ආචාර්ය සමිත හෙට්ටිගේ අධ්‍යක්ෂක (CEO) තුමා අත්සනින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත් එක පිරිනමන ලදී. මෙම කොන්ත්‍රාත්තුව ලබාදීමට ප්‍රධානම හේතුව වූයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ඉංජිනේරුවකුගේ සේවය සහ BOQ පිළියෙල කිරිම සඳහා පහසුකම් නොතිබූ නිසාය. කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුව භාරදී ඇත්තේ රාජ්‍ය ආයතනයකට වේ. ඉදිරි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් අනුව කටයුතු කරනු ඇත. | කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු අතර විධිමත් අනුමැතීන් සමඟ ගිවිසුම් වලට එළැඹිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) රුපියල් මිලියන 04 ක් වූ අනුමත මිලදී ගැනීම් සීමාව ඉක්මවා විද්‍යායතනයේ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.4,773,535 ක විදුලිජනක යන්ත්‍රය මිලදීගෙන තිබුණි. | විදුලි ජනක යන්ත්‍රයේ වටිනාකම රු.මිලියන 04 ට අඩුය. අනෙකුත් මිල ගණන් යන්ත්‍රය සවිකිරීම සම්බන්ධයෙන් යන මිල ගණන වේ. කෙසේ වෙතත් එම සියල්ලේම එකතුව සලකා කටයුතු කල යුතුනම් මින් ඉදිරියට ඔබගේ උපදෙස් පරිදි කටයුතු කල හැක. | ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදන සීමාවන් නොඉක්මවා කටයුතු කළ යුතු වීම. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යමණ්ඩල විස්තරය අනුව අධ්‍යන කාර්යමණ්ඩලයේ තනතුරු 02 ක පුරප්පාඩු 09 ක්ද, තනතුරු දෙකක අතිරික්තයක්ද, අනධ්‍යන කාර්යමණ්ඩලයේ තනතුරු 03 පුරප්පාඩු 11 ක්ද වශයෙන් පුරප්පාඩුව පැවතුණි.<br>(ආ)පුරප්පාඩු තනතුරු සඳහා දේශකවරුන් බඳවා නොගැනීම හේතුවෙන් රු.3,440,281 ක මුදලක් බාහිර දේශවරුන්ට සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීමට සිදුවී තිබුණි.<br>(ඇ)නඩත්තු ශිල්පී තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටියක් සකස්කර නොමැතිවීම හේතුවෙන් ඒ සඳහා සුදුසු අය බඳවාගැනීමට නොහැකිවී තිබුණි.<br>(ඈ)කථිකාචාර්ය තනතුර සඳහා 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා 25 දෙනෙකු බඳවාගෙන තිබුණද ඉන් 08 දෙනෙකු සේවය හැර ගොස් තිබුණි. | පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කරමින් පවතින බවට සඳහන් කර ඇත. | විද්‍යායතනයේ අරමුණු හා කටයුතු ඵලදායීතාවයෙන් කරගෙන යාමට තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 ඡේදය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත්, විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ කර වසර 04 ක් ගතවී තිබුණද අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් මාස තුනකට වරක් තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබේ. සියලුම විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි නිලධාරීන් පිරිසක් එම කමිටුවේ සාමාජිකත්වය දරයි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල විද්‍යායතන තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගෙන යාම බොහෝ සෙයින් හිතකරය. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව හා ජාතික විගණන පනතට අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන කමිටුවක් පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් මාස තුනකට වරක් තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබේ. සියලුම විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි නිලධාරීන් පිරිසක් එම කමිටුවේ සාමාජිකත්වය දරයි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල විද්‍යායතන තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගෙන යාම බොහෝ සෙයින් හිතකරය. | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවත් අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2017 දෙසැම්බර් 22 දින දීය. | ඉදිරි අයවැය ලේඛන පිළියෙල කිරීමේදී විගණන උපදෙස් අනුව කටයුතු කල හැක. | පවත්නා නීති රීති හා චක්‍රලේඛ වලට අනුව කටයුතු කල යුතුවීම සහ පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය උපයෝගී කර ගැනීමට කටයුතු කල යුතුවේ. |

**4.4 තිරසර සංවර්ධනය අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමේදි පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම යටතේ වූ ඉලක්ක හඳුනාගත යුතු වුවත් හඳුනාගෙන තිබුණේ දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණ විය. තවද හඳුනාගත් අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබූ අතර පාදක වර්ෂ හා පාදක දත්තද හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. | දරිද්‍රතාවය පිටු දැකීමෙ අරමුණට අමතරව පවත්නා අරමුණුද ලගා කර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ)සුදුසුකම්ලත් මානව සම්පත් හා භෞතික සම්පත්වල හිඟකම හේතුවෙන් අදාල අරමුණු හා ඉලක්ක ලගාකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැසුම් සකස් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුල විද්‍යායතනය විසින් ඊට සම්බන්ධිත පාර්ශවයන් හදුනාගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් හෝ චක්‍රලේඛ මගින් දැනුවත් කිරීම් සිදු කර නොතිබුණි. | පිළිගනිමි. | දරිද්‍රතාවය පිටු දැකීමේ අරමුණට අමතරව පවත්නා අරමුණුද ලගා කර ගැනීමට කටයුතු කල යුතුයි. |